# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 41 — 1973 ජනවාරි 05 වැනි සිකුරාදා — 1973.01.05**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)**


# I වැනි කොටස: (II අ) වැනි ඡේදය — පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 1 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 7 |


**සැලකිය යුතුයි.**—ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 15 දරන ආදායම් උපරිමය හා අනිවාර්ය ඉතිරි කිරීම් පිළිබඳ පනත, ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 16 දරන ප්‍රාග්ධන බදු (සංශෝධන) පනත සහ ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 17 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත 1973 ජනවාරි මස 05 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයන් වශයෙන් පලවේ.

# තනතුරු - ඇබෑර්තු

## ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම චූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහය රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට යටත් වන්නේ ය.

**3. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½ කට සමාන මුදලක් අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥාපනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවයෙහි සිටින්නන් හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

**4. රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියමකොට ඇත්නම් මිස, අදාළවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

---

### සැලකිය යුතුයි

ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදවල පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පළවන සතියට පෙර සතියේ බදාදා දවල් 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාද වී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් භාරගනු නොලැබේ.

1972 දෙසැම්බර් මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---


1——ජ 70750—16,266 (72/12)

(9) ඉල්ලුම්පත්‍රය බහා එවනු ලබන ලියුම් කවරයේ උඩ වම් කෙළවරේ ඉල්ලුම් කරන නිලය සඳහන් කළ යුතු වේ.

(10) ඉල්ලුම්පත්‍ර ලැබුණ බව දන්වා එවනු නොලැබේ.

(11) ඉල්ලුම්පත්‍ර 1973 ජනවාරි 31 වෙනි දින හෝ ඊට පෙර අධ්‍යක්ෂ, ලංකා ප්‍රමිති කාර්යාංශය, 53, ධර්මපාල මාවත, කොළඹ 3 වෙත ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි.

අධ්‍යක්ෂ,
ලංකා ප්‍රමිති කාර්යාංශය.

ආදර්ශ අයදුම් පත්‍රය

**ලංකා ප්‍රමිති කාර්යාංශය**

1. ඉල්ලුම් කරන තනතුර :————.
2. සම්පූර්ණ නම (අගට යෙදෙන නාමය මුලට) :————.
3. ලිපිනය :————.
*4. උපන් දිනය :————.
5. ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනට වයස :—
   අවුරුදු :——, මාස :——, දින :————.
6. ජාතිය :————.
*7. සුදුසුකම් :—
   (i) ශාස්ත්‍රාලයීය (දිනය, විෂයයන් හා ආයතනය සමග) : ————.
   (ii) වෘත්තීය (දිනය හා ආයතනය සමග) :————.
* 8. රැකියා වාර්තාව (දැරූ නිල සහ ලැබූ වැටුප් පිළිබඳ විස්තර දිය යුතු ය) :————.
* 9. පළපුරුද්ද :————.
*10. විශේෂ සුදුසුකම් :————.
*11. සිංහල ප්‍රවීණතාව :————.

මෙම ඉල්ලුම් පත්‍රයේ මා විසින් සඳහන් කර ඇති සියළුම විස්තර සත්‍ය වූද නිවැරදි වූද ඒවා බව මෙයින් සහතික කරමි. එමෙන් ම මේ සඳහන් විස්තර අසත්‍ය හෝ වැරදි හෝ ඒවා බව තෝරා ගැනීමට පෙර සොයා ගනු ලැබුවහොත් නුසුදුස්සෙකු වන බව ද පත්වීම ලැබුවාට පසු මෙහි සඳහන් විස්තර අසත්‍ය හෝ වැරදි හෝ ඒවා බව සොයා ගනු ලැබුවහොත් කිසිම වන්දියක් නොමැතිව සේවයෙන් පහ කිරීමට ඉඩ ඇති බව ද මම දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

†අධ්‍යක්ෂ මහතා.
ලංකා ප්‍රමිති කාර්යාංශය.

තෝරා ගැනුණ හොත් අයදුම්කරු නිදහස් කළ හැක/නොහැක.

————,
දෙපාර්තමේන්තු/සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩල/
පර්යේෂණ ආයතන/විශ්ව විද්‍යාල/ප්‍රධානියා.

දිනය :————.

*සනාථ කෙරෙන සහතිකවල පිටපත් ඉල්ලුම්පත්‍රය සමග එවිය යුතු වේ.

†අයදුම්කරු රජයේ සේවයේ හෝ රජයේ සංස්ථාවක හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පර්යේෂණ ආයතනයක හෝ විශ්ව විද්‍යාලයක හෝ සේවයේ නියුතු වූ අයෙකු නම් මෙම කොටස පිරවිය යුතු වේ.

1–1—73.01.05 දින අංක 41 දරණ ගැසට් පත්‍රය

---

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිලධාරි තනතුරු**

ශ්‍රී ලංකා යුද හමුදා කාර්‍ය සේවා ලංකා ඉංජිනේරු බලකායේ ආරක්ෂක සේනා ඉංජිනේරු තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

2. තෝරා පත් කර ගනු ලබන අපේක්ෂකයන්ට ශ්‍රී ලංකා යුද හමුදාවේ දෙවැනි ලුතිනන් නිලයෙහි ස්ථිර අධිකාරී පත්වීම් පිරිනමනු ලැබේ.

3. (අ) පත්වීම් ලැබීමේදී තෝරා පත් කර ගනු ලබන ඉල්ලුම්කරුවන්ට පහත දක්වා ඇති පරිදි නිලයට අනුකූලවූ වැටුප් හා දීමනා ගෙවනු ලැබේ. මේජර් නිලයට ඉහළ උසස් කිරීම තේරීම් අනුව වේ.

දෙවැනි ලුතිනන්—වාර්ෂික වැටුප—රු. 7,140.
(මාසික වැටුප—රු. 595.)

ලුතිනන්—වාර්ෂික වැටුප—රු. 7,500—5×180—රු. 8,400
(මාසික වැටුප—රු. 625—5×15—රු. 700)

කපිතාන්—වාර්ෂික වැටුප—රු. 9,240—8×180—රු. 10,680
(මාසික වැටුප—රු. 770—8×15—රු. 890)

මේජර්—වාර්ෂික වැටුප—රු. 11,400—8×240—රු. 13,320
(මාසික වැටුප—රු. 950—8×20—රු. 1,110)

ලුතිනන් කර්නල්—වාර්ෂික වැටුප—රු. 15,000—7×360—රු. 17,520
(මාසික වැටුප—රු. 1,250—7×30—රු. 1,460)

විවාහක නිලධාරීන්ගේ දීමනාව—

මසකට රු. 575 හා රු. 600 ට=මසකට රු. 80.00
මසකට රු. 600 හා රු. 625 ට=මසකට රු. 82.00
මසකට රු. 625 හා රු. 650 ට=මසකට රු. 85.00
මසකට රු. 650 හා රු. 675 ට=මසකට රු. 87.50
මසකට රු. 675 හා රු. 700 ට=මසකට රු. 90.00
මසකට රු. 700 හා රු. 725 ට=මසකට රු. 92.50
මසකට රු. 725 හා රු. 750 ට=මසකට රු. 95.00
මසකට රු. 750 හා රු. 775 ට = මසකට රු. 97.50
මසකට රු. 775 හා ඉන් ඉහළ=මසකට රු. 100.00

වෙනත් දීමනා.—

(i) මූලික නිල ඇඳුම් දීමනාව—රු. 1,000.00
(ii) නිල ඇඳුම් පවත්වා ගැනීමේ දීමනාව—මසකට රු. 25.00
(iii) අනුගාමික දීමනාව.—විවාහක නිලධාරීන්ට හා පිටත වාසය කිරීමට අවසර ලත් අවිවාහක නිලධාරීන්ට මසකට රු. 75.00 ක්.
(iv) වෙන්ව සිටීමේ දීමනාව.—
   (i) සාමාන්‍ය රාජකාරි සඳහා තුල වාසය කිරීමට නියම කර ඇති විවාහක නිලධාරීන්ට, දින 14 කට නොවැඩි අඛණ්ඩ කාලයක් තුල වාසය කිරීම සඳහා දිනකට රු. 1.50 බැගින්,
   (ii) හදිසි හා විශේෂ රාජකාරි සඳහා තුල වාසය කිරීමට නියම කර ඇති විවාහක නිලධාරීන්ට දින 14 කට වැඩි අඛණ්ඩ කාලයක් තුල වාසය කිරීම සඳහා දිනකට රු. 2.00 බැගිනි.
(v) ගමන් හා ඒකාබද්ධ දීමනා.—රජයේ සේවකයන්ට ගෙවන අයුරුය.

(ආ) නිලධාරීන්ගේ වැටුප්, මතු බලාපොරොත්තු හා සේවා කොන්දේසි සම්බන්ධයෙන් පහත සඳහන් රෙගුලාසි ඔවුන් කෙරෙහි බලපවත්වනු ඇත :—

(i) 1961 අප්‍රේල් මස 28 වැනි දින අංක 12,395 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබ කලින් කල සංශෝධිත 1961 යුද්ධ හමුදා වැටුප් සංග්‍රහය.
(ii) 1949 ඔක්තෝබර් මස 10 වැනි දින අංක 10,028 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබ, කලින් කල සංශෝධිත 1949 නිලධාරීනගේ රෙගුලාසි,
(iii) 1961 සැප්තැම්බර් මස 28 වැනි දින අංක 12,680 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබ, කලින් කල සංශෝධිත 1961 විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා සංග්‍රහය.

වෙනත් වැඩි විස්තර කොළඹ, යුද හමුදා මූලස්ථානයෙන් ලබා ගත හැක.

4. අපේක්ෂකයින් විසින් පහත සඳහන් කොන්දේසි සපුරාලිය යුතුය :—

(අ) ජාතිය.—ඉල්ලුම්කරුවන් ලංකාවේ පුරවැසියන් විය යුතුයි.
(ආ) වයස.—ඉල්ලුම්කරුවන් 1973.02,05 වැනි දිනට වයස අවුරුදු 28 ට නොවැඩි විය යුතුයි.
(ඇ) අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්.—පහත සඳහන් සුදුසුකම් වලින් එකක් ඔවුන්ට තිබෙන බවට අපේක්ෂකයින් විසින් සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(i) පිළිගත් විශ්ව විද්‍යාලයක සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධියක් ලැබූ, හෝ
(ii) ලංඩන් සිවිල් ඉංජිනේරු ආයතනය මගින් පවත්වනු ලබන විභාගයේ I වැනි හා II වැනි කොටස් වලින් සාමාර්ථය ලැබූ, හෝ
(iii) (ආදි රෙගුලාසි) අනුව පිළිගත් විශ්ව විද්‍යාලයකින් (සිවිල්) ඉංජිනේරු ශිල්පය පිළිබඳ පරීක්ෂණයේ I වැනි කොටසින් (ඒ සහ බී අංශයන්) හෝ (නව රෙගුලාසි) අනුව II කොටසින් සාමාර්ථය ලබා සහ උපාධි පාඨමාලාව සම්පූර්ණ (ආදි රෙගුලාසි) අනුව (සිවිල්) II කොටස හෝ

(නව රෙගුලාසි) අනුව III වෙනි කොටස සඳහා පෙනී සිටීමට සුදුසුකම් ලැබූ, හෝ

(iv) සිවිල් ඉංජිනේරුවන්ගේ ආයතනයෙහි (ලංඩන්) පරීක්ෂණයේ I වෙනි කොටසින් (ඒ සහ බී) අංශයෙන් සාමාර්ථය ලත් හෝ සී. ඊ. අයි. පරීක්ෂණයේ I වෙනි කොටසින් සාමාර්ථය ලත් හෝ ඉංජිනේරු ආයතනයෙහි (ලංකා) පරීක්ෂණයේ I වෙනි කොටසින් සාමාර්ථය ලත් සහ එයට අමතරව පුහුණුවීමේ පාඨමාලාව සම්පූර්ණ කර, ඉහතකී පරීක්ෂණයක II කොටස සඳහා සුදුසුකම් ලැබූ, හෝ

(v) සහකාර ඉංජිනේරුවන් වශයෙන් උසස් කිරීම සඳහා ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන පරීක්ෂණය සාර්ථක ලෙස සම්පූර්ණ කළ අය ; හෝ

(vi) අධ්‍යාපන අමාත්‍යාංශයේ හෝ ලංකා කාර්මික විද්‍යාලයේ කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ (සිවිල් පාඨමාලාවන් හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන කාර්මික සහායකයන්ගේ පාඨමාලාවෙන් හෝ සාමාර්ථය ලබා ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක හෝ විශාල ඉංජිනේරු සමාගමක තුන් අවුරුදු කාලයකට නොඅඩු කාර්මික ප්‍රායෝගික පළපුරුද්දක් ඇති අය.

(ඇ) **සෞඛ්‍ය තත්ත්වය.**—අයදුම්කරුවන් යුද හමුදාවට අවශ්‍ය සෞඛ්‍ය තත්ත්වය සපුරාලීමට සුදුසුකම් ලබා සිටිය යුතුය.

5. පහත දක්වා ඇති අන්දමට ඉල්ලුම්පත් තම අත් අකුරින් ලිවිය යුතු අතර, 1973.02.05 දින දහවල් 12 ට හෝ ඊට පෙර ලැබෙන සේ යුද හමුදා මූලස්ථානය, තැ. පෙ. 553, කොළඹ යන ලිපිනයට ඉදිරිපත් කළ යුතුයි. ඉල්ලුම් පත් බහාලන කවරයෙහි "ආරක්ෂක සේනා ඉංජිනේරු තනතුර සඳහා ඉල්ලුම් පත" යනුවෙන් සඳහන් කළ යුතුයි. අයදුම්පත් භාරගනු ලබන දිනයට හා වේලාවට පසු මෙම මූලස්ථානයට ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ. අයදුම් පත් නිකුත් කරනු නොලැබේ.

6. රජයේ සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ ඉල්ලුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතු අතර, යම්කිසි නිලධාරියෙකු තෝරා පත් කර ගනු ලැබුවහොත්, ඔහු සේවයෙන් නිදහස් කළ හැකි බවට සහතික කළ යුතුය. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය අඩංගු නොකළහොත් රජයේ විශ්‍රාම වැටුප් හිමි සේවා කාලය හමුදා විශ්‍රාම වැටුපට ගණන් ගනු නොලැබේ.

7. පහත සඳහන් ලියකියවිලිවල පිටපත් ඉල්ලුම් පතට අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය,

(ආ) තමා ලබා ඇති අධ්‍යාපනික සහතිකය/වෘත්තීය සුදුසුකම් පිළිබඳ උසස්ම සහතිකය,

(ඇ) අඩු ගණනේ චරිත සහතික පත් දෙකක්, මෙම සහතික පත් ඉල්ලුම්කරු පුද්ගලිකව දන්නා හඳුනන වගකිව යුතු පුද්ගලයන් ගෙන් මෑතදී ලබාගත් ඒවා විය යුතුය.

8. ලැබෙන ඉල්ලුම්පත් සංඛ්‍යාව ගැන සලකා බලා අවශ්‍ය වුවහොත් ඉහත සඳහන් සුදුසුකම් ඇති අය අතුරෙන් මූලික තේරීමක් කරනු ලැබේ. අවසාන තෝරා පත් කර ගැනීම කරනු ලබන්නේ, එසේ තෝරා ගත් ඉල්ලුම්කරුවන් ආරක්ෂක අමාත්‍යාංශය විසින් පත් කරනු ලබන තේරීම් මණ්ඩලයක සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් පසුවය. සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරා ගන්නා ඉල්ලුම්කරුවන්ට, එය පවත්වන ස්ථානය, දිනය සහ වේලාවන් ලියා දන්වනු ඇත. සම්මුඛ පරීක්ෂණය කොළඹ පැවැත්වෙන අතර, ඒ සඳහා ගමන් වියදම් හෝ අතිකුත් වියදම් රජයෙන් ගෙවනු නොලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරා ගනු නොලබන ඉල්ලුම්කරුවන්ට ඒ බව දන්වනු ඇත.

9. තෝරා පත් කර ගනු ලබන ඉල්ලුම්කරුවන් විසින් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමට සහ විශේෂයෙන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පණත ක්‍රියාත්මක කිරීම සඳහා, දැනටමත් දක්වා ඇති හෝ මින් පසුව පනවනු ලැබිය හැකි නීති රීතිවලට අනුකූලව කටයුතු කිරීම අවශ්‍යවේ.

10. තනතුර විශ්‍රාම වැටුප් සහිත නොවේ. අර්ථ සාධක අරමුදලක් සඳහා තම දායක මුදල් වශයෙන් තම ඒකාබද්ධ වැටුපෙන් සියයට හයක් අඩුකර ගැනීමට තම කැමැත්ත දෙන බවට තෝරාගනු ලබන අපේක්ෂකයින් විසින් ලියවිල්ලකින් ප්‍රකාශ කලයුතු වන්නේය. සේවා විශ්‍රාම වැටුපකට හෝ පාරිතෝෂික දීමනාවක් දීම පිළිබඳව 1961 යුද්ධ හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා සංග්‍රහයෙහි ඇති රෙගුලාසි මෙම තනතුර සඳහා අදාළ නොවන්නේය.

එම්. ඒ. ජයවීර,
බ්‍රිගේඩියර්,
යුද හමුදා ආඥපති වෙනුවට.

1972 දෙසැම්බර් මස 22 දින.

ශ්‍රී ලංකා යුද්ධ හමුදා කායික සේවා ලංකා ඉංජිනේරු බලකායේ ආරක්ෂක සේවා ඉංජිනේරු තනතුරු සඳහා ඉල්ලුම්පත

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

2. ජාතිය : (ලාංකිකයෙකු වූයේ පෙළපතින් ද නැතහොත් ලියාපදිංචි කිරීමෙන් ද ? ලියාපදිංචි කිරීමෙන් නම් සහතිකයේ අංකය සහ දිනය සඳහන් කරන්න) :————.

3. ලිපිනය :—
කාර්යාලයේ :————.
වාසස්ථානයේ :————.

4. උපන් දිනය : 1973.02.05 වැනි දිනට වයස :—
අවුරුදු :————, මාස :————, දින :————.

5. මවගේ සහ පියාගේ සම්පූර්ණ නම, උපන් ස්ථාන සහ දැන් ලිපිනය :
මවගේ :————.
පියාගේ :————.

6. ඔබ විවාහකද ? අවිවාහකද ? :————.

7. පාසැලේදී හෝ විශ්ව විද්‍යාලයේදී ඔබ විසින් කීර්තිය ලබා ඇති වෙනත් ක්‍රීඩා ශූරත්වයන් :————.

8. පාසැලේදී හෝ විශ්ව විද්‍යාලයේදී ඔබ විසින් කීර්තිය ලබා ඇති වෙනත් ක්‍රියාවන් :————.

9. සන්නද්ධ සේවයේ හෝ ස්වේච්ඡා බලසේනාවේ හෝ ශිෂ්‍ය භට බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයෙහි හෝ ඔබ ඉහතින් කිනම් සේවයක් කර තිබේද ? :————.

10. මෙම පදවිය ලැබීමට ඔබ සතු වෙනත් විශේෂ සුදුසුකම් මොනවාද ? :————.

11. මීට ඉහතින් යම්කිසි සන්නද්ධ සේවයකට බැඳීමට ඉල්ලුම් කෙළෙහිද ? එසේ නම් එහි ප්‍රතිඵලය වූයේ කුමක් ද ? :————.

12. ඔබගේ පාසැල් සමය විශ්ව විද්‍යාල සමය පිළිබඳ පහත සඳහන් විස්තර සපයන්න :—
පාසැලේ හෝ විශ්ව විද්‍යාලයේ නාමය :————.
ඇතුලත්වූ දිනය :————.
අස්වූ දිනය :————.
සමර්ථවූ ප්‍රසිද්ධ පරීක්ෂණය :————.

13. පාසැලෙන් හෝ විශ්ව විද්‍යාලයෙන් අස්වූ දින සිට ඔබ නියුක්ත වී සිටි රැකියාවන් පිළිබඳ පහත සඳහන් විස්තර දක්වන්න :—
ස්වාමි පක්ෂය :————.
රැකියාවේ ස්වභාවය :————.
සේවය කළ කාලය :————දින සිට————දින දක්වා.

14 ඔබට චරිත සහතික දුන් අයගේ නම් සහ ලිපිනයන් :————.

මෙම අයදුම්පතෙහි මවිසින් සඳහන් කරන ලද විසිත්තර සත්‍ය බවත් නිවැරදි බවත් මම මෙයින් සහතික කරමි.

————.
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය,————.

1-29—73.01.05 දින අංක 41 දරණ ගැසට් පත්‍රය

---

### වී අලෙවි මණ්ඩලය

ප්‍රධාන අභ්‍යන්තර ගිණුම් පරීක්ෂක තනතුර—II වෙනි ශ්‍රේණිය

ඉහත සඳහන් තනතුර සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ. අයදුම් පත් 1973 ජනවාරි මස 25 වැනි දිනට පෙර කොළඹ 5, එලිබැන්ක් පාරේ, අංක 5 දරණ ස්ථානයේ පිහිටි වී අලෙවි මණ්ඩලයේ සභාපති වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර අධ්‍යාපනික, චරිත හා උප්පැන්න සහතිකවල පිටපත් ද ඒ සමග එවිය යුතුය. අයදුම් පත්‍ර අඩංගු ලියුම් කවරයේ වම්පස උඩ කෙළවරේ "ප්‍රධාන අභ්‍යන්තර ගිණුම් පරීක්ෂක තනතුර සඳහා ඉල්ලුම් පත" යනු සඳහන් කළ යුතුය.

1. **අවශ්‍ය සුදුසුකම් :**

(අ) යටත් පිරිසෙයින් අවුරුදු 5 ක පළපුරුද්දක් ලත් වරලත් ගණකාධිකාරිවරයකු ; හෝ

(ආ) අභ්‍යන්තර ගිණුම් පරීක්ෂණ කටයුතු පිළිබඳ පළපුරුද්දක් ඇති I වැනි පන්තියට පහළ නොවන පන්තියක රජයේ ගණකාධිකාරිවරයකු ; හෝ

(ඇ) විගණකාධිකාරී සේවයේ I වැනි පන්තියට පහළ නොවන පන්තියක විගණකාධිකාරී නිලධාරියකු හෝ විය යුතුය.

2. **වැටුප් ක්‍රමය.**—රු. 1,500—10×50—රු. 2,000 සියලු දීමනා සමග මසකට සුදුසුකම් සහ පළපුරුද්ද සලකා බලා පත් කරනු ලබන තැනැත්තා මෙම තනතුරට අයත් වැටුප් ක්‍රමයේ වැටුප් පියවරක පිහිටුවනු ලැබේ.

3. **වයස.**—ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 50 ට නොවැඩි විය යුතුය. රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා මණ්ඩලවල සේවය කරන අයදුම් කරුවන්ට මෙම වයස් සීමාව බලපාන්නේ නැත.

4. **සෙසු කොන්දේසි.**—

(අ) ලාංකිකයන් විය යුතුය.

(ආ) තෝරාගනු ලබන අයදුම්කරුවන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන වලටත් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා සියලුම නීතිරීති හා ව්‍යවස්ථාවලටත් මතුවට පනවනු ලබන නීතිරීති හා ව්‍යවස්ථාවලටත් යටත් වනු ඇත.

(ඉ) රජයේ සේවයේ හෝ සංස්ථා සේවයේ යෙදී සිටින්නවුන් විසින් ඉදිරිපත් කරන අයදුම් පත්‍ර දෙපාර්තමේන්තු හෝ සංස්ථා ප්‍රධානීන් මගින් එවිය යුතුය.

සභාපති,
වී අලෙවි මණ්ඩලය.

අංක 5, එලිබැන්ක් පාර,
කොළඹ 5,
1972 දෙසැම්බර් මස 20 වැනි දින,

1–6—73.01.05 දින අංක 41 දරන ගැසට් පත්‍රය

---

## ශ්‍රී ලංකා නාවික හමුදාව

### ශිල්පීය නොවන අංශවලට නැවියන් බඳවාගැනීම

යාන්ත්‍රිකයින්, ඉන්දන කාර්මිකයින්, පණිවුඩ හුවමාරු කරුවන්, ලිපිකරුවන්, ගබඩා සහකරුවන්, ගිලන්හල් උපස්ථායකයින්, විදුලි කාර්මිකයින්, සූපකයින්, තේවකයින්, තූර්යවාදකයින් සහ රියැදුරන්, වශයෙන් ශිල්පීය නොවන අංශවලට නැවියන් බඳවා ගැනීම සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවේ ඇබෑර්තු ඇත.

2. පහත සඳහන් සුදුසුකම් ඇත්තා වූ හා අවශ්‍යතාවයන් සපුරාලන්නා වූ අයැදුම්කරුවන්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

3. (අ) **පොදු කොන්දේසි.**—අයැදුම්කරුවන්—

(i) ලාංකිකයෙකු විය යුතුය.

(ii) සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් හත්වැනි ප්‍රමාණය සමත්ව සිටිය යුතුය.

(iii) හොඳ චරිතයෙන් යුක්ත විය යුතුය.

(iv) පහත සඳහන් අවම ශාරීරික අවශ්‍යතාවයන් සපුරාලිය යුතුය :—

(අ) **උස :** අඩි 5 යි අඟල් 4 යි.
(ආ) **බර :** රාත්තල් 105 යි.
(ඇ) **පපුව :** අඟල් 32 යි (හුස්ම නැල්ලා).

(v) **වයස් සීමාව.**—1973 පෙබරවාරි මස 05 වැනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 21 ට නොවැඩි විය යුතුය :—

(vi) සෞඛ්‍ය තත්වය නාවික හමුදාධිපති විසින් නියමිත පරිදි වේ.

(ආ) **විශේෂ කොන්දේසි.**—පහත දක්වා ඇති අංශයන් සඳහා ඉල්ලුම් කරන්නා වූ අයැදුම්කරුවන්ට ඉහත 3(අ) ඡේදයේ සඳහන් පොදු කොන්දේසිවලට අමතරව පහත සඳහන් සුදුසුකම් ඇතොත් ඔවුන් සඳහා වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ :—

| | |
|---|---|
| ඉන්දන කාර්මික<br>විදුලි කාර්මික | (i) කාර්මික විද්‍යාලයන්හි හා වෘත්තීය පාසැල්වලින් ලද පුහුණුව හෝ පිළිගත් කාර්මික වෙළඳ සමාගම්වලින් ලද ආධුනිකත්වය, |
| | (ii) පොදු අධ්‍යයන සහතික (සාමාන්‍ය) විභාගයෙන් ගණිතය සමත් වී තිබීම. |
| පණිවුඩ හුවමාරුකරු | ඉංග්‍රීසි භාෂාව කියවීමට සහ ලිවීමට හැකියාවක් තිබීම. |
| ලිපිකරු ගබඩා සහකරු | (i) යතුරු ලියනය, ලඝු ලේඛනය, පොත් තැබීම, ගණන් තැබීම සම්බන්ධ දැනීම/පළපුරුද්ද, |
| | (ii) පොදු අධ්‍යයන සහතික (සාමාන්‍ය) විභාගයෙන් වාණිජ විෂයයන් හා ඉංග්‍රීසි භාෂාව සමත් වී තිබීම. |
| ගිලන්හල් උපස්ථායකයින් | (i) අධ්‍යයන පොදු සහතික (සාමාන්‍ය) විභාගයෙන් රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය සමත් වී තිබීම, |
| | (ii) බෙහෙත් ද්‍රව්‍ය මිශ්‍රණය සම්බන්ධ පළපුරුද්ද/ආධුනිකත්වය. |
| සූපකයින් | (i) හෝටල් පාසැලෙහි ලද පුහුණුව, |
| | (ii) පෙර සහ/හෝ අපරදිග සූප ශාස්ත්‍රය පිළිබඳ පළපුරුද්ද. |
| තේවකයින් | (i) හෝටල් පාසැලෙහි ලද පුහුණුව, |
| | (ii) ආවතේවකයේ, වේටර ගේ, බීම හල්කරුගේ රාජකාරීන් පිළිබඳ පළපුරුද්ද. |
| රියැදුරන් | බර වාහන පැදවීමේ ප්‍රවීණතා සහතිකයක් තිබීම. |
| තූර්ය වාදකයින් | (i) කුමන හෝ තූර්ය වාදක භාණ්ඩයක් වාදනය කිරීමේ හැකියාව, (පෙර හෝ අපරදිග) හසුරුවීම හෝ ගායනය, |
| | (ii) ක්ලැරිනට්ටය, සැක්සොෆෝනය, ට්‍රොම්බෝනය, ෆ්ලූටය (අපරදිග) පියානෝව, ගිටාරය හෝ උඩරට බෙරය දක්ෂ අන්දමින් වාදනය කිරීම. |

**සැලකිය යුතුයි.**—අදාළ පත්වීමට අවශ්‍ය කාර්මික හෝ විශේෂ දැනීමක් යම් අයදුම්කරුවෙකු සතුව ඇතොත් ඔහුගේ වයස් සීමාව අවුරුදු 45 දක්වා වැඩි කිරීමට සහ/හෝ අධ්‍යාපනික සුදුසුකම් වෙනස් කිරීම සලකා බලනු ලැබේ. මෙය විශේෂයෙන් ඉන්දන කාර්මික, විදුලි කාර්මික, තේවක, සූපක සහ රියැදුරු අංශවලට ඉල්ලුම් කරනු ලබන අයැදුම්කරුවන් සඳහා බලපානු ලැබේ.

4. **බඳවා ගැනීමේ ක්‍රමය.**—සමත් වූ අපේක්ෂකයින් බඳවා ගැනීමේ දී අංශවලට පත් කරනු ලැබේ. ඒ ඒ අංශවල ස්ථිරත්වය ආධුනික අභ්‍යාස පාඨමාලාවේ දී ඔවුන් විසින් හුවා දක්වන්නා වූ හැකියාවන් මත රඳා පවතී. එම පාඨමාලාව අවසානයේ දී තෝරා ගන්නා ලද අපේක්ෂකයින් අංශ අතර මාරු කිරීම හෝ සේවයෙන් පහ කිරීම නාවික හමුදාධිපතිගේ අභිමතය පරිදි සිදු විය හැක.

5. **සේවා කොන්දේසි.**—බඳවා ගනු ලබන දින වලංගුවන සහ ඉන්පසු වරින්වර සංශෝධනය කරනු ලබන 1950 දෙසැම්බර් 9 දින අංක 10,187 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද 1950 නාවිකයින් බඳවා ගැනීමේ සහ සේවා රෙගුලාසි අනුව සේවා කොන්දේසි පාලනය වේ.

6. **බඳවා ගැනීමේ කාලසීමාව.**—

(අ) සමත් වූ අපේක්ෂකයෙකු පළමුවෙන් අවුරුදු 12 ක කාලයක් සඳහා බඳවාගනු ලැබේ. මෙම කාලසීමාව තුළ ඔහුගේ සේවය සතුටුදායක වී නම් සම්පූර්ණ වශයෙන් අවුරුදු 33 කට වැඩි නොවන පරිදි ඔහුගේ සේවය දීර්ඝ කිරීමට ඉඩදෙනු ලැබේ. සාමාන්‍යයෙන් ඔහු අවුරුදු 22 ක කාලසීමාවක් සඳහා සේවය කරනු ලබන අතර ඉන් අවසානයේ දී ඔහු අර්ථසාධක අරමුදල් සහනයන්ට හිමිකරුවකු වනවා ඇත.

(ආ) මෙම යෝජනා ක්‍රමයට කරන ලද සංශෝධනයක් පිළිගෙන යම් අපේක්ෂකයෙකු බඳවා ගනු ලබන දිනට පෙර ක්‍රියාත්මක කළහොත් මෙම අවුරුදු 22 කේ කාලසීමාව වෙන් වෙන් වශයෙන් අවුරුදු 5, අවුරුදු 7 සහ අවුරුදු 10 වන සේ කාලසීමා 3 කට බඳවා ගැනීම/නැවත බඳවා ගැනීම කරනු ලැබේ. මෙවැනි අවස්ථාවන්හි දී සමත් වූ අපේක්ෂකයෙකු පළමු වතාවට අවුරුදු 5 ක් සඳහා බඳවා ගනු ලැබේ.

(ඇ) පටහැනිව කුමක් වුවද, නැවියෙකු වයස අවුරුදු 55 පිරීමෙන් සෑම බඳවා ගැනීමක් හෝ නැවත බඳවා ගැනීමක් නිම වේ.

7. (අ) **වැටුප් හා දීමනා ප්‍රමාණය.**—නැවියෙකුගේ ස්ථිර තරාතිරම අනුව අදාළ වන ඒකාබද්ධ වැටුප් ප්‍රමාණයන් පහත පරිදි වේ :—

| | |
|---|---|
| ආධුනික | ... රු. 2,700 වාර්ෂිකව |
| සාමාන්‍ය නැවි | ... රු. 2,880—15×60—රු. 3,780 |
| බල නැවි | ... රු. 3,060—15×60—රු. 3,960 |
| නායක නැවි | ... රු. 3,660—15×72—රු. 4,740 |

| | |
|---|---|
| සුළු නිලධාරි | ... රු. 4,62001— × 90—රු. 5,520 |
| ප්‍රධාන සුළු නිලධාරි | ... රු. 5,010—10 × 90—රු. 5,910 |
| පාලක ප්‍රධාන සුළු නිලධාරි | ... රු. 5,640—10 × 144—රු. 7,080 |

(ආ) විශේෂඥයන් වශයෙන් නාවික හමුදාවෙන් පුහුණු කරනු ලබන නැවියන් මීට වඩා සුළු වැටුප් වැඩි ප්‍රමාණයකට හිමිකම් ලබනු ඇත.

(ඇ) විවාහක නැවියෙකුට රාජ්‍ය සේවා කොන්දේසි අනුව ඔහුගේ තරාතිරමට අදාල වන පරිදි විවාහක දීමනාවක් ගෙවනු ලැබේ. අතිකුත් දීමන 1972 නාවික වැටුප් සංග්‍රහය අනුව ගෙවනු ලැබේ.

8. බඳවා ගැනීම සඳහා එවනු ලබන ඉල්ලුම්පත් සම්බන්ධයෙන් පහත සඳහන් ව්‍යවස්ථා අදාළ වේ :—

(අ) මෙම නිවේදනය අවසානයෙහි දැක්වෙන ආදර්ශ ආකෘතියට අනුව ඉල්ලුම්පත් සකස් කළ යුතුය ;

(ආ) ඉල්ලුම් පත් නාවික හමුදාධිපති, නාවික හමුදා මූලස්ථානය, තැ. පෙ. 593, කොළඹ 1, යන ලිපිනයට එවිය යුතුය. ඒවා බහා එවන ලියුම් කවරයේ උඩ වම් කෙළවරෙ “ බඳවා ගැනීම —නැවියන් ” යනුවෙන් සටහන් කළ ‘යුතු අතර 1973 පෙබරවාරි මස 05 වැනි දින දහවල් 12 ට පෙර නාවික හමුදා මූලස්ථානයට එවිය යුතුය ;

(ඇ) රජයේ සේවකයින් විසින් එවනු ලබන ඉල්ලුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් එවිය යුතු අතර තෝරා ගතහොත් නිදහස් කරන බවට දෙපාර්තමේන්තු ප්‍රධානියාගෙන් ලබාගත් ලිපියක් ද ඒ සමග එවිය යුතුය ;

(ඈ) ඉල්ලුම්පත් සමග පහත සඳහන් ලියකියවිලි එවිය යුතුය :—

(i) අයදුම්කරුගේ චරිතය සහ බඳවා ගැනීමට ඇති යෝග්‍යතාවය පිළිබඳ ප්‍රදේශයේ ග්‍රාම සේවකගෙන් ලබාගත් සහතිකයක් ;

(ii) ග්‍රාම සේවක විසින් පිටුපස සහතික කරන ලද අයැදුම්කරුගේ ඉකුත් උපන් දිනට හෝ ඊට පසුව ලබාගත් ඡායාරූපයක් ;

(iii) අයැදුම්පත ලද බව දන්වා එවීම සඳහා තමන්ගේ ලිපිනය ලියන ලද ලියුම් කවරයක්.

9. **රාජ්‍ය භාෂාව.**—ස්ථිර නාවික බල බඳවා ගනු ලැබූ තෝරාගත් අපේක්ෂකයින් 1956 වර්ෂයේ අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ද බඳවා ගනු ලබන කල හෝ ඉන් පසු කලින් කල එම පනතට අදාළ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු වස් පැනවිය හැකි සියළු ව්‍යවස්ථා නියෝග හෝ උපදෙස් අනුගමනය කරන බවට ලියවිල්ලකින් ගිවිසිය යුතුය.

10. මෙම ඇබෑර්තු සඳහා සැලකිල්ලක් අපේක්ෂා කරන සේවා මුක්ත භටයෙක් වේ නම්, ඉහත සඳහන් පොදු කොන්දේසිවලට අමතරව පහත සඳහන් දෑ ඔප්පු කළ යුතුය—

(අ) ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවන්හි, බ්‍රිතාන්‍ය පොදු රාජ්‍ය මණ්ඩලීය සන්නද්ධ හමුදාවන්හි හෝ ලංකා ආරක්ෂක හමුදාවන්හි වර්ෂයකට නොඅඩු සේවා කාලයක් තිබූ බවට,

(ආ) සන්නද්ධ සේවාවන්ගෙන් මුදා හැරීමේ දී හෝ අස් කිරීමේ දී ඔහුගේ චරිතය “ ඉතා හොඳ ” යන්නට වඩා පහළට වර්ග කර නොතිබූ බව,

(ඇ) සම්පූර්ණ සක්‍රිය සේවා කාලය නිවැරදිව අවුරුදු, මාස සහ දින ගණනින්.

11. අයැදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවන අවස්ථාවේ දී පහත සඳහන් සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය :—

(අ) උප්පැන්න සහතිකය හෝ (උපත ලියාපදිංචි නොකරනු ලැබූ අයදුම්කරුවන් වෙනුවෙන්) රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරන ලද විශේෂ වයස් සහතිකය,

සැ. යු.—වයස සනාථ කිරීම වස් බෞතීස්ම සහතික, උපකෘත පාඨශාලා ව්‍යවස්ථා සඳහා නිකුත් කෙරෙන උප්පැන්න සහතික, සඳහන් ආදිය පිළිගනු නොලැබේ.

(ආ) **අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ සහතික.**—පාසල හැර යෑමේ සහතිකය (හෝ අයැදුම්කරු තවමත් පාසැලේ ශිෂ්‍යයෙකු නම් පාසැලේ ප්‍රධානාචාර්යවරයාගෙන් ලබාගන්නා ලද ලිපියක්) සහ සමත් කරන ලද සෑම රජයේ විභාගයක් සඳහා හෝ එවැනි විභාගයක දී සමත් වූ විෂයයන් සඳහා නිකුත් කරන ලද සහතික,

(ඇ) ග්‍රාමසේවක විසින් නිකුත් කරනු ලැබූ සහතිකය හැර අයැදුම්කරුගේ චරිතය සහ බඳවා ගැනීමට ඇති යෝග්‍යතාවය පිළිබඳව ලබාගන්නා ලද චරිත සහතික තුනක්. අයදුම්කරු රක්ෂාවක නියුක්ත වේ නම් ඉන් එකක් තම වර්තමාන ස්වාමියාගේ නිර්දේශයක් විය යුතුය.

12. තැපැලේ දී නැතිවුණ, ප්‍රමාද වන ඉල්ලුම්පත් පළිබඳව කෙරෙන චෝදනාවන් ගැන සලකා බලනු නොලැබේ. පමා වී ඉල්ලුම් පත් එවන අපේක්ෂකයින් විසින් පමාවීමේ ප්‍රතිඵල විඳිය යුතුය.

13. තම ලිපිනය ලියන ලද ලියුම් කවරයක් එවා තිබුණොත් පමණක් ඉල්ලුම් පත ලද බව දන්වා එවනු ලැබේ.

14. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ මාර්ගයෙන් එවනු ලබන ඉල්ලුම් පත්‍ර ඒවා භාර ගන්නා අවසාන දිනට පසුව මෙම කාර්යාලයට ලැබුණේ නම්, භාර ගන්නා අවසාන දිනට පෙර දෙපාර්තමේන්තු ප්‍රධානියාට ලැබී ඔහු විසින් ප්‍රමාදය පිළිබඳ පිළිගත හැකි කරුණු සහිතව ඉදිරිපත් කළ හොත් පමණක් භාරගනු ලැබේ.

15. සුදුසු සේ සැලකෙන අයැදුම්කරුවන් මූලික සම්මුඛ පරීක්ෂණය කට කැඳවනු ලැබේ. (එක් අංශයකට වඩා ඉල්ලුම් කර ඇති අයැදුම් කරුවන් එක් මූලික සම්මුඛ පරීක්ෂණයකට වඩා කැඳවීමට ඉඩ ඇත.) ඔවුන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ මෙම නිවේදනයේ 3 (අ) ඡේදයේ පොදු කොන්දේසි (1)-(5) අනුව සුදුසුකම් ලබා ඇතොත් පමණි. තවදුර පරීක්ෂණ සඳහා තෝරා ගනු ලබන අයැදුම්කරුවන්ට වෛද්‍ය පරීක්ෂණ එකකට හෝ කිහිපයකට පෙනී සිටීමට සිදු වෙනවා ඇත. අවසාන තෝරා ගැනීමේ මණ්ඩලයකින් පසුව පමණක් අවසාන තෝරා ගැනීම සිදු කෙරේ.

සැ. යු.—සම්මුඛ පරීක්ෂණ හෝ වෛද්‍ය **පරීක්ෂණ** සඳහා පැමිණීමට ගමන් ගාස්තු හෝ වෙනත් කිසිදු වියදමක් ගෙවනු නොලැබේ.

16. තම දෙමාපියන්ගේ හෝ නීත්‍යානුකූල භාරකාරයාගේ කැමැත්ත පළකොට ලිපියක් පළමුව ඉදිරිපත් නොකළහොත් අයැදුම්කරුවෙකු බඳවා ගනු නොලැබේ. එම කැමැත්ත පළ කෙරෙන ලිපිය තම ප්‍රදේශයේ ග්‍රාම සේවක විසින් සහතික කරවා ගැනීම අවශ්‍ය වේ.

17. ඉල්ලුම්කරුවෙකු නිර්දේශ කිරීමට කැමති කෙනෙක් වේ නම් ඔහු විසින් ඉල්ලුම්කරුට සහතිකයක් දිය යුතුය. ඉල්ලුම්කරුවෙකුගේ තෝරා ගැනීම පිළිබඳව යම්කිසි පෙළඹවීමක් හෝ බලපෑවැත්වීමක් සඳහා ප්‍රයත්නයක් ඇති වූයෙහි නම් ඉල්ලුම්කරු ඒ තනතුර සඳහා නුසුදුස්සෙකු වීමට ඉඩ ඇත.

18. යම් ඉල්ලුම්කරුවෙකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බව ඔහු තෝරා ගැනීමට පෙර සොයා ගත්තේ නම් ඒ හේතුවෙන්ම ඔහු යථෝක්ත තනතුර සඳහා නුසුදුස්සෙකු බවට පත් කිරීමටත්, බඳවා ගැනීමට පසුව අනාවරණය වුණි නම් විනයානුකූලව ක්‍රියා කිරීමට සහ නාවික හමුදාවෙන් පහ කිරීමටත් ඉඩ තිබේ.

ඩී. වී. හන්ටර්,
කොමදෝරු,
නාවික හමුදාධිපති.

1972 දෙසැම්බර් මස 21 දින,
කොළඹ දී ය.

### ඉල්ලුම් පත්‍රය

### නැවියන් සඳහා ඇබෑර්තු—ශ්‍රී ලංකා නාවික හමුදාව

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

2. ඉල්ලුම් කරන ලද අංශය (ප්‍රමුඛත්වය මත) :—
   (අ) :————.
   (ආ) :————.
   (ඇ) :————.

3. ලිපිනය (තැපැල් කාර්යාලය ඇතුළුව) :————.

4. පළාත :————.

5. ඡන්ද කොට්ඨාශය :————.

6. උපන් දිනය :————.

7. 73. 02. 05. වැනි දිනට වයස :————.

8. සමත් වූ විෂයයන් සහ දිනයන් සමග අධ්‍යාපනික සුදුසුකම් :————.

9. විභාගය සමත් වූ මාද්‍යය :————.

10. ඉල්ලුම් කර ඇති සෑම අංශයක් සඳහා 3 (ආ) ඡේදය අනුව අයැදුම්කරුට ඇති විශේෂ සුදුසුකම් :—
   (අ) :————.
   (ආ) :————.
   (ඇ) .————.

11. වෙනත් සුදුසුකම් :————.

12. ක්‍රීඩාවලින් ලත් ජය :————.

13. පාසැලෙන් අස්වීමෙන් පසු රැකියාව (සම්පූර්ණ විස්තර සපයන්න) :————.

14. දනට රැකියාව :————.

15. උස : අඩි :——, අඟල් ——.
බර : රාත්තල් :————.
පපුව : අඟල් :——.

16. ජාතිය :————.

17. කිට්ටුම පොලිස් ස්ථානය :————.

18. මීට ප්‍රථම නාවික, යුද්ධ, ගුවන් හා ස්වේච්ඡා සේවාවන් හි සේවය කර ඇතොත් දිනයන් සහ දරූ තනතුරු පිළිබඳ සම්පූර්ණ විස්තර :————.

19 මුද්‍රාහැරීමේ දී/අස් කිරීමේ දී හැසිරීම :————.

20. අදාළ වෙනත් විස්තර :————.

21. සහතික පත්‍රය ලබාගත් ග්‍රාම සේවකයාගේ නම :————.

ඉහත සඳහන් විස්තර මගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය ඒවා බව මෙයින් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

1-35—73.01.05 දින අංක 41 දරණ ගැසට් පත්‍රය

---

## ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ ඇබෑර්තු

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ සංස්කාරක සහායක හා භාෂා පරිවර්තක (දෙමළ) මාණ්ඩලික VI වෙනි ශ්‍රේණියේ තනතුරක් සඳහා ලංකාවේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**සුදුසුකම්.**—දෙමළ භාෂාවෙන් පරීක්ෂණ සංස්කරණය හා විශේෂාංග රචනා කටයුතු පිළිබඳ වසර පහකට නොඅඩු පළපුරුද්ද, කාර්මික අංශ ශාස්ත්‍රය සහ වානිජ විද්‍යාවට අදාල සිංහල/දෙමළ හා/හෝ, ඉංග්‍රීසි/දෙමළ පරිවර්තක කටයුතු පිළිබඳ වසර පහක පළපුරුද්ද ඇති උපාධිධාරියෙකු වීම.

**වයස.**—ඉල්ලුම් පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් ක්‍රමය.**—රු. 720—රු. 40×7 රු. 50×5—රු. 1,250 (සියළු දීමනා අඩංගු මාසික)

මෙම කාර්යාලයට පැමිණ හෝ ශත 15ක මුද්දර අලවා තම ලිපිනය ලියූ, 9½"×4½" ප්‍රමාණයේ ලියුම් කවරයක් එවීමෙන් හෝ ලබාගත හැකි ආකෘති පත්‍රයේ වියයුතු අයදුම්පත් 1973 ජනවාරි 25 දින හෝ ඊට ප්‍රථම පහත සඳහන් අයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. තැපෑලේදී නැතිවන හෝ ප්‍රමාදවන අයදුම්පත් ගැන ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය වග කියනු නොලැබේ.

රජයේ සේවකයින්ගේ ව්‍යවස්ථාපිත මණ්ඩලවල හා සංස්ථාවල සේවකයින්ගේත් අයදුම් පත් සලකා බලනු ලබන්නේ තෝරාගනු ලැබුවහොත් ඉල්ලුම්කරු මුදා හරිනු ලබන බවට අදාල දෙපාර්තමේන්තුවේ, මණ්ඩලයේ හෝ සංස්ථාවේ ප්‍රධානියා විසින් සහතික කරනු ලැබ ඇත්නම් පමණි.

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ,
සාමාන්‍යාධිකාරී.

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය,
අංක 16, ග්‍රෙගරි පාර,
කොළඹ 7.

1-34—73.01.05 දින අංක 41 දරණ ගැසට් පත්‍රය

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## අධ්‍යාපන අමාත්‍යාංශය—ලංකා කාර්මික විද්‍යාලය, මරදාන

### ස්වයංචල යන්ත්‍රකනය සිංහල (සන්ධ්‍යා) (මෝටර් යාන්ත්‍රික විද්‍යාව) පාඨමාලාවට ඇතුල්වීම

### 1973 අධ්‍යයන වර්ෂය

මරදානේ ලංකා කාර්මික විද්‍යාලයේ වෘත්තිය අංශයේ පහත සඳහන් පාඨමාලාවට ඇතුළත් කිරීම සඳහා ඉල්ලුම් පත්‍ර භාර ගනු ලැබේ:—

| පාඨමාලාවේ නම | මාධ්‍යය | කාල පරිච්ඡේදය | කාලය |
| --- | --- | --- | --- |
| ස්වයංචල යන්ත්‍රනය ... (මෝටර් යාන්ත්‍රික විද්‍යාව) | සිංහල ... | අවු. 2 යි ... | සන්ධ්‍යා |

2. ඉහත සඳහන් පාඨමාලාවට ඇතුළත් වීම සඳහා ප්‍රවේශ පරීක්ෂණයක් නොපැවැත් වේ. ඇතුළත් වීම තීරණය කරනු ලබන්නේ වාචා පරීක්ෂණයක් මගිනි.

3. අදල වෘත්තියට සම්බන්ධිත රැකියාවන් වල යෙදී ඇති අයවලුන්ගෙන් ලැබෙන ඉල්ලුම් පත්‍ර පමණක් සැලකිල්ලට ගනු ලබන අතර සියලුම පත්‍ර සේවා යෝජකයා මගින් ඉදිරිපත් කළ යුතුය. සේවා යෝජකයා විසින් ඉල්ලුම් පත් නිර්දේශ කිරීමේ දී අයදුම්කරුවන්ගේ සේවයේ ස්වභාවය, වැඩකල කාලය, පැහැදිලිව සඳහන් කළ යුතුය. ඉහත සඳහන් අවශ්‍යතාවයට අනුකූල නොවන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4. **අවශ්‍ය සුදුසුකම් :—**

i. අටවන ප්‍රමාණය සමත්වීම හෝ/අටවන ශ්‍රේණිය සමත්වීම හෝ/කණිෂ්ඨ සහතිකය තිබීම.

ii. වයස—1973.01.01 දිනට වයස අවුරුදු 17 නො අඩුවිය යුතුය.

iii. මනා චරිතයකින් යුක්ත වීම හා ලාංකික පුරවැසියකු වීම.

5. පහත සඳහන් ආදර්ශ ඉල්ලුම් පත්‍රය අනුව පිළියෙල කරන ලද සියලුම ඉල්ලුම් පත්‍ර 1973 ජනවාරි 27 දිනට හෝ ඊට පෙර කොළඹ 10, ලංකා කාර්මික විද්‍යාලයේ ලේඛකාධිකාරි වෙත ලියාපදිංචි කැපැලෙන් එවිය යුතුය.

6. අසම්පූර්ණ හෝ නියමිත ආකෘති පත්‍රයෙහි නිසි ලෙස පුරවා නොමැති හෝ ප්‍රමාද වී ලැබුන හෝ සියළුම ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සෑම අධ්‍යයන වර්ෂයකදීම නියමිත මාස 9 යකට විද්‍යාලීය ගාස්තු මසකට රු. 5 බැගින් අයකරනු ලබන බවද, මින් දන්වමි.

ටී. ඕ. පී. ප්‍රනාන්දු,
අධ්‍යාපන අධ්‍යක්ෂක (කාර්මික),
අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.

අධ්‍යාපන අමාත්‍යාංශය,
මැලේ වීදිය,
කොළඹ 2.
1972 දෙසැම්බර් 7.

**(ආදර්ශ අයදුම් පත්‍රය )**

**(8½" ×13½"—ප්‍රමාණයේ කඩදසිවල සකස් කළයුතුය)**

**ලංකා කාර්මික විද්‍යාලය—අධ්‍යයන වර්ෂය 1973—ඇතුළුවීමේ අයදුම්පත**

**වැදගත්**—මෙම අයදුම්පත සම්පූර්ණ කොට කොළඹ 10, ලංකා කාර්මික විද්‍යාලයේ ලේඛකාධිකාරි වෙත කෙලින්ම එවිය යුතුය.

1. පාඨමාලාව :————. සන්ධ්‍යා

2. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.
(පැහැදිලි අකුරින්)

3. මුලකුරු සමඟ නම :————.

4. උපන් දිනය :————.
1973.01.01 දිනට වයස :—අවුරුදු :——, මාස :——, දින :——

5. ජාතිය :————.

6. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

7. පුද්ගලික ලිපිනය :————.

8. රාජකාරි ලිපිනය :————.

9. සමාර්ථය ලත් විභාග (වර්ෂය සහ මාසයත් සඳහන් කරන්න. විෂයයන් සහ ප්‍රවීණතා සහිතව).

10. කලින් මෙම විද්‍යාලයේ උගත් ශිෂ්‍යයන් පමණක් මෙය පිරවිය යුතුය :

ප්‍රවේශ පත්‍රයේ අංකය :————.

උගත් පංති :————.

වර්ෂ :————.

(ලබාගත් සහතික සඳහන් කළ යුතුය)

11. අයදුම්කරුගේ රක්ෂාව කුමක් ද, එය කවරෙකු යටතේ ද යන වග සහ ඔහුගේ ලිපිනය රැකියාවේ ස්වභාවය පිළිබඳ සම්පූර්ණ විස්තර සැපයිය යුතුයි :————.

12. පියාගේ/භාරකාරයාගේ නම ලිපිනය සහ රක්ෂාව :————.

13. මෙහි ඉහත සඳහන් කරුණු සැබෑ බවට සහතික කරමි.

————.
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

1-27—73.01.05 දින අංක අංක 41 දරණ ගැසට් පත්‍රය

---

අංකය : 1/83/31 (ඊ)

## රජයේ ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රේණියට අයත් ලඝු ලේඛකයින්ගේ II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

### (සම්මේලන වාර්තා කිරීම—සිංහල) 1972

රජයේ ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රේණියට අයත් ලඝු ලේඛකයින්ගේ II වන කාර්යක්ෂමතා කඩඉමෙන් සාමාර්ථය ලැබීමට සුදුසුකම් ලැබීමේ පරීක්ෂණය සම්බන්ධයෙන් පහත සඳහන් කර ඇති දිනවල දී පවත්වනු ලැබූ සම්මේලන වාර්තා කිරීමේ (සිංහල) පරීක්ෂණයේ දී පහත නම් සඳහන් ලඝු ලේඛක/ලේඛිකාවන් සමත් වී ඇති බව මෙයින් දනුම් දෙමි. වාර්ෂික ඒකාබද්ධ වැටුප රුපියල් 5,736 ට පෙර කාර්යක්ෂමතා කඩඉමෙන් ඔබබට උසස් කිරීම සඳහා නියමිත පරීක්ෂණය ඔවුන් දන් සම්පූර්ණ කර ඇත.

| නම | දෙපාර්තමේන්තුව | විභාගය පවත්වන ලද දිනය |
|---|---|---|
| සෙනෙවිරත්න, ආර්. ඩී. සී. | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | 1972. 5.25 |
| ප්‍රනාන්දු, පී. ඕ. එල්. | අලෙවි කිරීමේ | එම |
| ආරියදාස, ඒ. එල්. | ගොවිජන සේවා | එම |
| විතාරණ, ඩී. මිය. | දේශීය ආදායම් (මාතර) | එම |
| පෙරේරා, බී. එම්. ඒ. මිය. | ජනතා කමිටු | එම |
| සුමනා විමලසේන මිය. | නිවාස හා ගොඩනැගිලි අමාත්‍යාංශය | එම |
| නෙත්තිකුමාර, එන්. ඒ. ඒ. | දිසාපති කාර්යාලය, කුරුණෑගල | 1972. 5.31 |
| කොඩිකාර, ඩී. මිය. | අධ්‍යාපන, ගාල්ල | එම |
| අභයපාල, කේ. ජී. එම්. මිය. | ගොවිජන සේවා | එම |
| පෙරේරා, ඩබ්ලිව්. එච්. | රෙදිපිළි නීතිගත සංස්ථාව | එම |
| කරුණාවතී, ඩබ්ලිව්. එච්. මිය. | කුඩා කර්මාන්ත | එම |
| ගුණසේකර, වී. ඒ. මිය. | ආනයන හා අපනයන | එම |
| ලෙනෝරා, ආර්. අයි. පී. මෙනවිය | නැව් කටයුතු හා සංචාරක කටයුතු අමාත්‍යාංශය | එම |
| බුමා හේරත් මිය. | තැපැල් හා විදුලි සංදේශ | 1972. 6. 2 |
| කොඩිකාර, ජී. ඒ. පී. | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | එම |
| වීරසේකර, ටී. ඒ. ඩී. ජී. | පළාත් පාලන | එම |
| මෙත්තානන්ද, පී. මිය. | දකුණු කොළඹ මහේස්ත්‍රාත් උසාවිය | එම |
| හෙට්ටිආරච්චි, බී. එල්. මිය. | දේශීය ආදායම් | එම |
| පත්මලතා ජිනදාස මිය. | දේශීය ආදායම් | එම |
| ද සිල්වා, ඩී. සී. යූ. මිය. | ජල සම්පාදන හා ජලාපවහන... | 1972. 6. 5 |
| ජයසිංහ, කේ. බී. | ප්‍රාදේශීය අධ්‍යාපන කාර්යාලය, ග්‍රින්පාත්, කොළඹ 7 | එම |
| ජයධීර, ඩී. එස්. මිය. | කුඩා කර්මාන්ත | එම |
| දළුගොඩ, ජී. එල්. මිය. | ග්‍රාම සංවර්ධන | එම |
| වීරසිංහ, එස්. මිය. | දේශීය ආදායම් | එම |
| ද අල්විස්, එස්. කේ. වී. මිය. | දේශීය ආදායම් | එම |
| අමරජීව, ඒ. එම්. | දිස්ත්‍රික් උසාවිය, ගම්පහ | එම |
| ද සිල්වා, කේ. එල්. ඩබ්. පී. මිය. | ආගමන හා විගමන | 1972. 6. 6 |
| අයිරාංගනී, බී. පී. මිය. | පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය | එම |
| පීරිස්, බී. වී. ඩී. එස්. පී. මිය. | ගොවිජන සේවා | එම |
| රාජපක්ෂ, ඒ. | දිස්ත්‍රික් උසාවිය, මාතර | එම |
| චන්ද්‍රාවතී රොද්‍රිගු මිය. | ධීවර | එම |
| මීගොඩ, එන්. මිය. | වාරිමාර්ග | එම |
| රියෙන්සි ඩයස්, කේ. | දිස්ත්‍රික් උසාවිය, ගම්පහ | එම |
| අමරවීර, එස්. පී. මිය. | රජයේ ගණන් | එම |
| කරුණාරත්න, එම්. බී. ආර්. එස්. මිය. | දිස්ත්‍රික් උසාවිය, ගම්පහ | 1972. 6. 7 |
| පීටර්, ඒ. මිය. | සමාජ සේවා | එම |
| රාජපක්ෂ, එල්. මිය. | ඉඩම් නිරවුල් කිරීමේ | එම |
| විජේදාස, පහළ විතාන | මිළ පාලන | එම |
| වීරතුංග, එච්. බී. | නුවරඑළිය මහේස්ත්‍රාත් උසාවිය | 1972. 6. 8 |
| ධර්මදාස, ටී. එම්. | අපරාධ යුක්ති විනිශ්චය කොමිෂන් සභා කාර්යාලය | එම |
| හිලේරියන්, ජේ. ඩී. ඩබ්. | කම්කරු | එම |

| නම | දෙපාර්තමේන්තුව | විභාගය පවත්වන ලද දිනය |
|---|---|---|
| මල්ලිකා කහවිට, මිය. | රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 1972. 6. 8 |
| කුරේ, එම්. පී. මිය. | දිස්ත්‍රික් උසාවිය, පානදුර | එම |
| කරුණා විතානවසම් මිය. | කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යාංශය | එම |
| වෙදගේ, බී. ඩී. මිය. | ළමා උසාවිය, බම්බලපිටිය | එම |
| කුසුමා ධර්මරත්න මිය. | ජනලේඛන හා සංඛ්‍යාලේඛන | 1972. 6.13 |
| ධනවතී ශීගනගේ මිය. | අධ්‍යාපන අමාත්‍යාංශය | එම |
| ජයසුන්දර, වයි. එල්. මිය. | දේශීය ආදායම් | එම |
| ප්‍රෙමලතා ගුණදස, එම්. මිය. | දේශීය ආදායම් | එම |
| සූරියප්පෙරුම, ඩබ්. සී. වී. මිය. | දේශීය ආදායම් | එම |
| බුද්ධදස, එල්. එච්. ඒ. | මහේස්ත්‍රාත් උසාවිය, ගම්පහ | 1972. 6.14 |
| නානායක්කාර, පී. | දිසාපති කාර්‍යාලය, මාතලේ | එම |
| කන්නන්ගර, බී. එල්. මෙනෙවිය | කම්කරු | එම |
| ප්‍රේමා ජයසූරිය මිය. | අධ්‍යාපන අමාත්‍යාංශය | එම |
| ඇන්සි යසරත්න මිය. | විභාග | 1972. 6.15 |
| ප්‍රනාන්දු, එම්. එම්. මිය. | දේශීය ආදායම් | එම |
| සුබසිංහ, ඩබ්ලිව්. එල්. මිය. | තැපැල් හා විදුලි සංදේශ | එම |
| පතිරණ, එච්. | කෘෂිකර්ම | එම |
| පෙරේරා, එම්. පී. | කම්කරු | 1972. 6.16 |
| ගනේපොල, ජී. ඒ. බී. | දිසාපති කාර්‍යාලය, කළුතර | එම |
| ද සිල්වා, ඒ. ඩී. ජේ. ආර්. මිය. | අපරාධ යුක්ති විනිශ්චය කොමිෂන් සභා කාර්‍යාලය | එම |
| කරුණාරත්න, එල්. සී. මිය. | පළාත් පාලන | එම |

ආර්. එම්. බී. සේනානායක,
රාජ්‍ය පරිපාලන අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.

1972 දෙසැම්බර් මස 27 වැනි දින,
කොළඹ 7, ටොරින්ටන් චතුරශ්‍රයේ,
රාජ්‍ය පරිපාලන දෙපාර්තමේන්තුවේ,
ඒකාබද්ධ සේවා අංශයේ දී ය.

1–40—73.01.05 දින අංක 41 දරණ ගැසට් පත්‍රය

---

## ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II වැනි පන්තියට උසස් කිරීම සඳහා වූ විශේෂ තරඟ විභාගය

1972 ඔක්තෝබර් මස 20 වැනි දින ශ්‍රී ලංකා ජන රජයේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ පළ වූ, 1972 ඔක්තෝබර් මස 13 වැනි දින දරණ නිවේදනයට අනතුරුව, පූර්වෝක්ත විභාගය 1973 ජනවාරි මස 20 වැනි හා 21 වැනි දිනයන් හි පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්.

1972 දෙසැම්බර් මස 21 දින,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ දී ය.

1–26—73.01.05 දින අංක 41 දරණ ගැසට් පත්‍රය

---

## ශ්‍රී ලංකා පරිපාලන සේවයට බඳවා ගැනීම සඳහා පැවැත්වෙන විවෘත තරඟ විභාගය—1972

### සංශෝධනය

1972 දෙසැම්බර් මස 8 වැනි දින දරණ, ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළවූ පූර්වෝක්ත විභාගය පිළිබඳ නිවේදනය, එහි 4 (ඈ) ඡේදයෙන් නියම කර ඇති සුදුසුකම් පිළිබඳ කොන්දේසිවල කොටසක් වශයෙන් පහත දැක්වෙන අතිරේක උපඡේදයක් ඇතුළත් කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

" 1973 ජනවාරි මස 1 වැනි දිනට පූර්වාසන්නයෙන් වූ පස් අවුරුද්ද තුළ හෝ 1973 ජනවාරි මස 1 වැනි දිනට පූර්වාසන්නයෙන් සේවයේ යෙදී ඇති කාලය පස් අවුරුද්දකට අඩු නම් එම කාලය තුළ හෝ සතුටුදායක සේවා වාර්තාවක් ඇත්නම් විනා, රාජ්‍ය සේවයේ, පළාත් පාලන සේවයේ හෝ රාජ්‍ය සංස්ථා සේවයේ හෝ මණ්ඩලවල හෝ අනෙකුත් දෙපාර්තමේන්තුමය ආයතනවල හෝ ස්ථිර නිලධාරියෙක්/නිලධාරිණියක් මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් නොලබයි. නිලධාරියෙකුට/නිලධාරිණියකට සතුටුදායක සේවා වාර්තාවක් තුබූ සේ සලකනු ලබන්නේ, අදාළ සේවා කලය තුළ ලැබිය යුතු වේතනාධික. සියල්ලම නිලධාරියා/නිලධාරිණිය විසින් උපයා ගෙන ඇත්නම් සහ එම කාලය තුළ මොනම ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) ඔහු/ඇ යටත් වී නොමැති නම් පමණි.

73.1.1 වැනි දිනට පූර්වාසන්නයෙන් වූ පස් අවුරුද්දට කලින් වූ තමාගේ සේවා වාර්තාව මුළුමනින්ම සතුටුදායක නොවූ නිලධාරියෙකු/නිලධාරිනියක මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබන නමුත්, ඔහු/ඇ භාජන වී ඇති කවර හෝ විනයානුකූල දඬුවමක් සහ/හෝ අයහපත් සටහන් හෝ වරද තැබීම් හෝ අවවාද කිරීම්, වාචික පරීක්ෂණයේදී ලකුණු පිරිනැමීමේදී සැළකිල්ලට ගනු ලැබේ."

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්.

1972 දෙසැම්බර් මස 19 වැනි දින,
කොළඹ 7, නිදහස් චතුරශ්‍රයේ
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේදී ය.

1–30/1—73.01.05 දින අංක 41 දරණ ගැසට් පත්‍රය

## ශ්‍රී ලංකා පරිපාලන සේවයට බඳවා ගැනීම සඳහා පැවැත්වෙන සීමිත තරඟ විභාගය—1972

**සංශෝධනය**

1972 දෙසැම්බර් මස 8 වැනි දින දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළවූ පූර්වෝක්ත විභාගය පිළිබඳ නිවේදනය, එහි 4 වැනි ඡේදයෙහි නියම කර ඇති සුදුසුකම් පිළිබඳ කොන්දේසිවල කොටසක් වශයෙන්, පහත සඳහන් ඡේදය එකතු කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

" ඉකුත් පස් අවුරුද්ද තුළ තමාගේ සේවා වාර්තා අසතුටුදායක වී ඇති කිසිම නිලධාරියෙක්/නිලධාරිණියක් මෙම විභාගයට පෙනී සුදුසුකම් නොලබයි. නිලධාරියෙකුට/නිලධාරිණියකට සතුටුදායක සේවා වාර්තාවක් ඇතැයි සලකන්නේ 1973 ජනවාරි මස 1 වන දිනට පූර්වාසන්නයෙන් වූ පස් අවුරුදු කාලය තුළ, එම නිලධාරියා/නිලධාරිණිය විසින් වේතනාධික සියල්ලම උපයාගෙන ඇත්නම් සහ මොනම ආකාරක හෝ විනයානුකූලඩුවමකට (අවවාද කිරීම් හැර) යටත් වී නොමැති නම් පමණි.

1973 ජනවාරි මස 1 වැනි දිනට පූර්වාසන්නයෙන් වූ පස් අවුරුද්දකට කලින් අසතුටුදායක සේවා වාර්තාවක් තිබූ නිලධාරියකු/නිලධාරිණියක මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබන නමුත් ඔහු/ඇ භාජන වී ඇති කවර හෝ විනයානුකූල දඬුවමක් සහ/හෝ කවර අයහපත් සටහන් හෝ වරද තැබීම් හෝ අවවාද කිරීම්, වාචික පරීක්ෂණයේ දී ලකුණු පිරිනැමීමේ දී සැළකිල්ලට ගනු ලැබේ."

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ
සවදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ලේකම්.

1972 දෙසැම්බර් මස 19 වැනි දින,
කොළඹ 7, නිදහස් චතුරශ්‍රයේ
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේදී ය.

1–30/2—73.01.05 දින අංක 41 දරණ ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන අමාත්‍යාංශය—ලංකා කාර්මික විද්‍යාලය, මරදාන-වාණිජ අංශයේ පාඨමාලාවන්ට ඇතුලත්වීම

**අධ්‍යයන වර්ෂය—1973**

මරදාන ලංකා කාර්මික විද්‍යාලයේ වානිජ අංශයේ පහත සඳහන් අධ්‍යයන පාඨමාලාවලට ඇතුලත්වීම සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

| පාඨමාලාව | මාධ්‍යය | කාලපරිච්ඡේදය | කාලය |
|---|---|---|---|
| (1) තක්සේරු ඩිප්ලෝමා ... | ... ඉංග්‍රීසි/සිංහල | ... අවුරුදු 4 | ... පළමුවන හා දෙවන වසර—පූර්ණ දිවාකාල<br>තෙවන හා සිව්වන වසර—සන්ධ්‍යා කාල |
| (2) ප්‍රවාහණය පිළිබඳ වෘත්තීය පාඨමාලාව | ... ඉංග්‍රීසි | ... අවුරුදු 4 | ... සන්ධ්‍යා කාල පාඨමාලාව |
| (3) ලඝුලේඛණය පිළිබඳ උසස් පාඨමාලාව | ... ඉංග්‍රීසි/සිංහල | ... අවුරුදු 1 | ... සන්ධ්‍යා කාල පාඨමාලාව |

ඉහත සඳහන් කවර අධ්‍යයන පාඨමාලාවකට වුවද, ඇතුලත්වීම සඳහා ප්‍රවේශ පරීක්ෂණයක් නොපැවැත්වේ. ඇතුලත්වීම තීරණය කරනු ලබන්නේ වාචා පරීක්ෂණයක් මගිනි.

තක්සේරු ඩිප්ලෝමා පාඨමාලාව සම්බන්ධයෙන් හැර, ඉහත සඳහන් සෙසු පාඨමාලාවන්ට සම්බන්ධිත රක්ෂාවන්හි යෙදී ඇති අයවලුන්ගෙන් ලැබෙන ඉල්ලුම්පත්‍ර පමණක් සැලකිල්ලට ගනු ලබන අතර, සියලු ඉල්ලුම්පත්‍ර සේවා යෝජකයා මගින් ඉදිරිපත් කළ යුතුය. සේවා යෝජකයා විසින් ඉල්ලුම්පත් නිර්දේශ කිරීමේදී අයදුම්කරුවන් ගේ සේවයේ ස්වභාවය, වැඩකල කාලය, පැහැදිලිව සඳහන් කළ යුතුය. ඉහත සඳහන් අවශ්‍යතාවනට අනුකූල නොවන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ඉහත සඳහන් පාඨමාලාවන් සඳහා යෝග්‍යතා :—

(අ) අවශ්‍ය අවම අධ්‍යාපන සුදුසුකම් :—

**තක්සේරු ඩිප්ලෝමාව :**

අ.පො.ස. (උ.පෙ.) විභාගයෙන් විෂයයන් තුනකින් සාමාර්ථය ;

සහ

අ.පො.ස. (උ.පෙ.) විභාගයෙන් ගණිතය සමත්වීම හෝ අ.පො.ස. (සා.පෙ.) විභාගයෙන් ගණිතයට සම්මාන සාමාර්ථයක් තිබීම ;

ඉංග්‍රීසි මාධ්‍යයෙන් පාඨමාලාව හැදෑරීමට බලාපොරොත්තු වන අපේක්ෂකයනට අ.පො.ස. (සා.පෙ.) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාවට සාමාර්ථයක් තිබිය යුතුය.

**ප්‍රවාහණය පිළිබඳ වෘත්තීය පාඨමාලාව :**

ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය (ඉංග්‍රීසි) හෝ අ.පො.ස. (සා.පෙ.) විභාහයෙන් ඉංග්‍රීසි භාෂාවට සාමාර්ථයක් සහිතව, විෂයයන් හයකින් සාමාර්ථයක් හෝ ලන්ඩන් ප්‍රවාහන ආයතනයේ ශිෂ්‍යයකු ලෙස ලියාපදිංචි වීම.

වැදගත්.—ප්‍රවාහණ ආයතනවල හෝ රජයේ දෙපාර්තමේන්තුවල හෝ රජයේ සංස්ථාවල හෝ පොදු ආයතනවල හෝ ව්‍යාපාරික ආයතනවල ප්‍රවාහන අංශවල සේවයේ නියුක්ත අයට පමණක් අයදුම්පත් ඉදිරිපත් කළ හැකිය.

**ලඝු ලේඛණය පිළිබඳ උසස් පාඨමාලාව :**

(1) ලංකා කාර්මික විද්‍යාලයීය ලඝු ලේඛක පහත් පෙළ සහතිකය සිංහල/ඉංග්‍රීසි ; හෝ
(2) ලංකා කාර්මික විද්‍යාලයේ ලඝු-යතුරු ලියන්නන්ගේ වානිජ සහතිකය සිංහල/ඉංග්‍රීසි ; හෝ
(3) ලන්ඩන් වානිජ මණ්ඩලයේ ලඝු-යතුරු ලියන්නන්ගේ සහතිකය (ඉංග්‍රීසි මාධ්‍යය පාඨමාලාව සඳහා පමණක් අදාළ වේ) ; හෝ
(4) කනිෂ්ඨ පාඨශාලා සහතිකය සහිතව රජයේ හෝ සංස්ථාවල හෝ පිළිගත් ව්‍යාපාරික ආයතනයක හෝ වෙනත් රජයේ ආයතනයක හෝ ලඝුලේඛකයකු වශයෙන් අවුරුදු දෙකක වත් සේවයක් ලබා තිබීම.

(ආ) සෙසු යෝග්‍යතා—

(අ) මනා චරිතයකින් යුක්ත වීම ;

(ආ) ලාංකික පුරවැසියකු වීම ;

(ඇ) 1973.1.1 දිනට වයස අවුරුදු 17 ට නොඅඩුවීම.

පහත සඳහන් ආදර්ශ ඉල්ලුම්පත්‍ර අනුව පිළියෙල කරන ලද සියළුම ඉල්ලුම්පත්‍ර 1973 ජනවාරි මස 27 වැනි දිනට හෝ ඊට පෙර කොළඹ 10, ලංකා කාර්මික විද්‍යාලයේ ලේඛකාධිකාරි වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

අසම්පූර්ණ හෝ නියමිත ආකෘති පත්‍රයට අනුකූලව පුරවා නොමැති හෝ ප්‍රමාද වී ලැබුන හෝ ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සෑම අධ්‍යයන වර්ෂයකදීම නියමිත මාස නවයකට විද්‍යාලයීය ගාස්තු පහත සඳහන් අන්දමට මාසිකව අයකරනු ලබන බවද මින් දන්වමි :—

(1) තක්සේරුකරු ඩිප්ලෝමා පාඨමාලාව (තෙවන, සතරවන, අවුරුදු සඳහා පමණක්) මසකට ... රු. 15
(2) ප්‍රවාහනය පිළිබඳ වෘත්තීය පාඨමාලාව මසකට ... ... ... රු. 15
(3) ලඝුලේඛණය පිළිබඳ උසස් පාඨමාලාව මසකට ... ... ... රු. 10

ටී. ඕ. පී. ප්‍රනාන්දු,
අධ්‍යාපන අධ්‍යක්ෂ (කාර්මික),
අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.

1972 දෙසැම්බර් මස 14 වැනි දින,
අධ්‍යාපන අමාත්‍යාංශය,
මැලේ වීදිය, කොළඹ 2.

## ලංකා කාර්මික විද්‍යාලය—අධ්‍යාපන වර්ෂය 1973

### ඇතුලත් වීමේ අයදුම්පත

**වැදගත්.**—මෙම ආකෘති පත්‍රය සම්පූර්ණ කොට කෙළින් ම කොළඹ 10, ලංකා කාර්මික විද්‍යාලයේ, ලේඛකාධිකාරි වෙත ලියාපදිංචි තැපැලෙන් යැවිය යුතුය.

1. පාඨමාලාව :————. සන්ධ්‍යා :————.

2. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.

3. මුලකුරු සමග නම :————.

4. උපන් දිනය :————.
   1973.1.1 දිනට වයස : අවුරුදු :————. මාස :————. දින :————.

5. ජාතිය :————.

6. ස්ත්‍රී පුරුෂ බව :————.

7. පෞද්ගලික ලිපිනය :————.

8. ව්‍යාපාර ලිපිනය :————.

9. සමත් වූ විභාග (අවුරුද්ද හා මාසය, විෂයයන් හා ලබා ගත් ශ්‍රේණීන් සඳහන් කරන්න) :————.

10. මෙම කොටුව පිරවිය යුත්තේ, මීට ඉහත දී මෙම විද්‍යාලයේ පාඨමාලාවකට සහභාගි වූ අයදුම්කරුවන් විසින් පමණි :—

    ප්‍රවේශ පත්‍ර අංකය :————.

    හදාරන ලද පාඨමාලාව :————.

    වර්ෂ :————.

    (ලබා ගත් සහතික සඳහන් කරන්න)

11. අයදුම් කරුගේ රැකියාව, සේවා යෝජකයාගේ නම සහ ලිපිනය, අයදුම්කරු විසින් ඉටු කරනු ලබන කාර්යයන්ගේ ස්වභාවය පිළිබඳ සම්පූර්ණ විස්තර සඳහන් කළ යුතුය :————.

12. පියා/මව/භාරකරු/ගේ නම, ලිපිනය සහ රැකියාව :————.

මා විසින් සපයා ඇති ඉහත සඳහන් තොරතුරු සියල්ල සත්‍ය බව මෙයින් ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

1-23—73.01.05 දින අංක 41 දරණ ගැසට් පත්‍රය

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ

# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන සංශෝධිත ගාස්තු

1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට ක්‍රියාත්මක වේ

(සෑම සිකුරාද දිනයන්හි පළ කරනු ලැබේ)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිට ය.

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සෙනසුරාදා පෙරවරු 8 සිට දවල් 12 දක්වාද, වෙනත් දිනවල පෙරවරු 8 සිට පස්වරු 3.30 දක්වාද කාර්‍යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුයි.

4. සෙනසුරාද පෙරවරු 11ට සහ වෙනත් දිනවල පස්වරු 2.30 ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපෑලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක්පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළකරන්නාට නියමිත "පිටපත" **කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි.** ටයිප් ගසා එවන්වා නම් වඩාත් හොඳයි.

7. **සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරන ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... | 20 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... | 20 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 220 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 440 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. **සෑම සිකුරාද දිනයකම ශ්‍රී ලංකා ජනරජයේ "ගැසට්" පත්‍රය පළකරනු ලැබේ.** ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. 1966 මාර්තු 1 වෙනිද සිට ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් **කොළඹ, රජයේ මුද්‍රණාලයේ, මුද්‍රණාලයාධිපති** තැනට ලැබෙනසේ එවිය යුතුයි.

13. **1968.12.1 දින සිට සංශෝධිත දායක ගාස්තු* :—**

**ආණ්ඩුවේ ගැසට් පත්‍රය—වාර්ෂික**

| | මෙරට රු. | ශ. | පිටරට රු. | ශ. |
|---|---|---|---|---|
| එක් කොටසක් ... ... ... | 46 | 0 | 60 | 0 |
| I වැනි කොටසේ එක ඡෙදයක් ... ... | 36 | 0 | 42 | 0 |
| I වැනි කොටසේ ඡෙද දෙකක් .. ... | 43 | 50 | 51 | 50 |

**වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නො අඩු කාලයකට පමණ ය.**

*** තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)**

| | මිළ රු. | ශ. | තැපැල් ගාස්තු මෙරට රු. | ශ. |
|---|---|---|---|---|
| (අ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළත දී එක කොටසක් ... | 0 | 50 | 0 | 20 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, එක කොටසක් ... ... | 1 | 0 | 0 | 20 |
| (ආ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළත දී, I වැනි කොටසේ එක ඡෙදයක් | 0 | 30 | 0 | 15 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, I වැනි කොටසේ ඡෙදයක් ... | 0 | 60 | 0 | 15 |

**දායක මුදල් බාර ගැනීම සහ තනි පිටපත් විකිණීම බාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.**

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊලඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. **සියළුම දායක මුදල් කොළඹ මහාලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරි වෙත නොව **ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති** වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

**1973**

| මාසය | පළකිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | |
|---|---|---|---|
| ජනවාරි ... | 73. 1. 5 සිකුරාද ... | 72.12.27 බදාද | දවල් 12.00 |
| | 73. 1.12 සිකුරාද ... | 73. 1. 3 බදාද | දවල් 12.00 |
| | 73. 1.19 සිකුරාද ... | 73. 1.10 බදාද | දවල් 12.00 |
| | 73. 1.26 සිකුරාද ... | 73. 1.17 බදාද | දවල් 12.00 |
| පෙබරවාරි ... | 73. 2. 2 සිකුරාද ... | 73. 1.24 බදාද | දවල් 12.00 |
| | 73. 2. 9 සිකුරාද ... | 73. 1.31 බදාද | දවල් 12.00 |
| | 73. 2.15 බ්‍රහස්පතින්දා ... | 73. 2. 7 බදාද | දවල් 12.00 |
| | 73. 2.23 සිකුරාද ... | 73. 2.14 බදාද | දවල් 12.00 |
| මාර්තු ... | 73. 3. 2 සිකුරාද ... | 73. 2.21 බදාද | දවල් 12.00 |
| | 73. 3. 9 සිකුරාද ... | 73. 2.28 බදාද | දවල් 12.00 |
| | 73. 3.16 සිකුරාද ... | 73. 3. 7 බදාද | දවල් 12.00 |
| | 73. 3.23 සිකුරාද ... | 73. 3.14 බදාද | දවල් 12.00 |
| | 73. 3.30 සිකුරාද ... | 73. 3.21 බදාද | දවල් 12.00 |
| අප්‍රියෙල් ... | 73. 4. 4 සිකුරාද ... | 73. 3.28 බදාද | දවල් 12.00 |
| | 73. 4.11 බදාද ... | 73. 4. 4 බදාද | දවල් 12.00 |
| | 73. 4.19 බ්‍රහස්පතින්දා ... | 73. 4.11 බදාද | දවල් 12.00 |
| | 73. 4.27 සිකුරාද ... | 73. 4.18 බදාද | දවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 ඔක්තෝබර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.